# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2373/42 - 2024 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2024.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, අංක 2360/52 දරන 2023 නොවැම්බර් මස 30 දිනැති *ගැසට් නිවේදනය* මගින් දක්වා ඇති නියෝගයේ සංයෝජිත වර්ගීකරණ අංක 0804.10.10 සහ 0804.10.20 යටතට වැටෙන, විදේශ රාජ්‍යයන්, ව්‍යාපාරික ආයතන ඇතුළු සංවිධාන, ස්වේච්ඡා සංවිධාන හා හිතෛෂීන් විසින් පරිත්‍යාග හෝ ත්‍යාග වශයෙන් විදේශ විනිමය වැයනොවන පදනමින් ලබාදෙන, රටඉඳි ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 200 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය 2024 මාර්තු මස 02 දින සිට 2024 අප්‍රේල් මස 11 දින දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 මාර්තු මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 03- 0016

1A - PG 6662 — 429 (2024/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.